## ළමා ගීත වලට සවන් දීම

ගීතය ඇසුරෙන් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න

# ඉරෙන් හඳෙන්

ඉරෙන් හඳෙන් - එළිය අරන්
ගහෙන් වැලෙන් - සුවඳ අරන්
ඇළෙන් දොළෙන් - සිසිල අරන්
අපට සැදුණු - අපේ ලෝකයේ
ඉරෙන් හඳෙන් - එළිය අරන්
ගහෙන් වැලෙන් - සුවඳ අරන්
ඇළෙන් දොළෙන් - සිසිල අරන්
අපට සැදුණු - අපේ ලෝකයේ
සතුටු වෙන්න - එන්න යාළුවේ ...//

සමනල තටු - සිදින්නෙපා
පාට මැකී යයි - දේදුන්නේ
ගහවැල සිඳ - දමන්නෙපා
පොළොව දැවී -යයි ඉර ගින්නේ
අපට සැදුන-අපේ ලෝකයේ
සතුට සදා - රකිමු යාළුවේ...//

නටා ගයන -බතිටි මලිත්තෝ
අපා දෙපා - සිව්පා ඇත්තෝ
ඉරේ හඳේ - ගහේ වැලේ
අපි වගේ ම - උරුමය ඇත්තෝ
අපට සැදුණු -අපේ ලෝකයේ
සතුට බෙදා -ගනිමු යාළුවේ...//

(01) එළිය ගත්තේ මොනවායින් ද? ...................................................................

(02) සිසිල අරගන්නේ මොනවායින් ද? ..............................................................

(03) නටා ගයන්නේ කවුරුන් ද? ..........................................................................

(04) තටු සිදින්න එපා කියන්නේ කාගේ ද?............................................................

(05) පොළව දැවෙන්නේ කුමකින් ද? ....................................................................

(06) පාට මැකී යන්නේ කුමක ද?.........................................................................

(07) මෙහි සිටින කුරුල්ලෝ කවු ද?......................................................................

(08) සිවුපා සතෙක් නම් කරන්න? .......................................................................

(09) අපා(පාද නැති) සතෙක් නම් කරන්න? ...........................................................

(10) දෙපා සතෙක් නම් කරන්න?..........................................................................